## 2019-05-28 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. ඉවතලන පොලිතින් හා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කිරීම පිණිස පයිරොලයිසිස් යන්ත්‍රයක් (Waste Plastic Pyrolysis Machine) ස්ථානගත කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 13)**

නාගරික ප්‍රදේශවලින් ඝන අපද්‍රව්‍යයක් ලෙස ජනනය වන හා අවිධිමත් ලෙස බැහැර කරනු ලබන පොලිතින් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට භාජනය නොකර අවිධිමත් ලෙස බාහිර පරිසරයට බැහැර කිරීම ප්‍රබල පාරිසරික හා සෞඛ්‍යමය ගැටලුවක් බවට පත්ව ඇත. නාගරික කසළ සමඟ මිශ්‍රව පවතින පොලිතින් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය පයිරොලයිසිස් තාක්ෂණය යොදා ගනිමින් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා දකුණු කොරියාවේ ඔමේගා එනර්ජි එන්වයිරොටෙක් ආයතනය විසින් යන්ත්‍රයක් නිර්මාණය කරනු ලැබ ඇත. මෙම යන්ත්‍රය මඟින් පොලිතින් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය පයිරොලයිසිස් තෙල් හා කාබන් කුඩු බවට පරිවර්තනය කරන අතර, එම තෙල් ඉන්ධනයක් වශයෙන්ද, කාබන් කුඩු මාර්ගවල අතුරන ගල් නිෂ්පාදනය සඳහාද යොදා ගැනීමේ හැකියාව පවතියි. ඔමේගා එනර්ජි එන්වයිරොටෙක් ආයතනය විසින් මෙම යන්ත්‍රය මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රදානය කිරීමට එකඟතාව පළ කරනු ලැබ ඇත. ඒ අනුව, එය ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ අත්තනගල්ල පෙතියාකන්ද කාබනික පොහොර අංගනයේ ස්ථාපිත කිරීම පිණිස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා වශයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 15)**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට තම චංචල දේපළ ඇතුළු වත්කම් කොටසක් උපයෝගී කරගෙන ණය පහසුකම් ලබාගනිමින් ව්‍යාපාර වර්ධනය කරගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත අහෝසි කර, සුරක්ෂිතලත් ගනුදෙනුවල නීතිමය රාමුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝජනා වී ඇත. ඒ අනුව, 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත අහෝසි කොට නව පනතක් කෙටුම්පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර, එසේ කෙටුම්පත් කරනු ලබන පනත් කෙටුම්පත්

හේතුවෙන් දැනට ක්‍රියාත්මකව පවතින කාලාවරෝධ ආඥාපනත, භාර ලදුපත් ආඥාපනත, උකස් පනත, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරන පනත, 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත, 2007 අංක 07 දරන සමාගම් පනත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යනාදියද සංශෝධනය කළ යුතු බවට හඳුනාගැනීමෙන් අනතුරුව ඒ සඳහාද අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, කෙටුම්පත් කරනු ලැබ ඇති සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත සමගම සංශෝධනය කළ යුතු බවට හඳුනාගෙන ඇති ඉහත සඳහන් පනත් හා ආඥා පනත් 07 සංශෝධනය කිරීම සඳහා කෙටුම්පත් කරන ලද පනත් කෙටුම්පත් ගැසට් පත්‍රයේ පළ කර ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 19)

1861 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කරන ලද හක්ගල උද්භිද උද්‍යානය නැරඹීමට වාර්ෂිකව දේශීය හා විදේශීය නරඹන්නන් ලක්ෂ 9ක් පමණ පැමිණෙති. ඉහළ ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුගතවීම සඳහා උද්භිද උද්‍යානය සංවර්ධනය කිරීම මඟින් වැඩි නරඹන්නන් පිරිසක් තවදුරටත් ආකර්ෂණය කරගැනීමේ හැකියාව පවතින බවට නිරීක්ෂණය වී ඇත. ඒ අනුව 2023 වර්ෂය වන විට මෙම උද්භිද උද්‍යානයේ ආදායම 25%කින් වැඩි කරගැනීම සහ නව රැකියා අවස්ථා බිහිකිරීම මඟින් උද්‍යානය අවට ප්‍රදේශයේ සමාජ ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා උද්‍යානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. පෞරාණික ශාකාගාර නිදර්ශක දිරාපත්වීමෙන් ආරක්ෂා කරගැනීම, උද්‍යානය තුළ විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම, අධ්‍යාපනික ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කිරීම සහ වෘක්ෂලතා සඳහා ජාතික බීජ බැංකුවක් ස්ථාපිත කිරීම ඇතුළත් උද්‍යානය වැඩිදියුණු කිරීමේ මෙම ව්‍යාපෘතිය 2019-2023 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීම පිණිස සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 21)**

සංචාරකයින් අතර නැඟී එන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රචලිත වී තිබුණු අතර, එම තත්ත්වය තවදුරටත් වර්ධනය කරගැනීමේ අරමුණින් මෙරටට විදේශීය සංචාරකයින් රැගෙන ආ විදේශීය චාරිකා මෙහෙයවන්නන් හා එක්ව ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සැලසුම් කරනු ලැබ ඇත. ඒ අනුව, වසරකට මගීන් 250කට අධික සංඛ්‍යාවක් මෙරටට රැගෙන එන විදේශීය චාරිකා මෙහෙයවනන් හා එක්ව රුපියල් මිලියන 150ක පමණ ආයෝජනයක් යටතේ යෝජිත වැඩසටහනන ක්‍රියාත්මක කිරීමටත්, එක්සත් රාජධානිය, ඉන්දියාව, රුසියාව, ඉතාලිය, ඊශ්‍රායලය, ජර්මනිය, චීනය, යුක්රේනය, ජපානය, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව, බෙන්ලක්ස්, කොරියාව, ගල්ෆ් හා ස්කැන්ඩිනේවියානු රාජ්‍යයන්වල චාරිකා මෙහෙයවන්නන් වෙතින් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යෝජනා ලබාගැනීමටත් සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් සංචාරක ක්ෂේත්‍රයට එල්ල වූ අහිතකර බලපෑම අවම කරගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 22)**

සංචාරක ක්ෂේත්‍රය තුළින් උපයන ආදායම හා එම ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා වර්ධනය කරගැනීමේ අරමුණින් 'ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම 2017 - 2020' ක්‍රියාත්මකව පවතින අතරතුර මෑතක දී එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් ඉහත අරමුණු ඉටුකර ගැනීම අභියෝගයක්ව පවතී. එබැවින් එයට පිළියමක් ලෙස ඒකාබද්ධ මහජන සම්බන්ධතා හා කෙටිකාලීන අලෙවි හා සන්නාම සන්නිවේදන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිත ගෝලීය නියෝජිතායතනයක් මඟින් දින 45ක කාලයක් සඳහා කෙටිකාලීන මහජන සම්බන්ධතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ සංචාරක සන්නාම නාමය යළි ප්‍රචලිත කරගැනීම සඳහා මාස 06ක කාලපරිච්ඡේදයක් පුරා දැන්වීම් ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. අනුරාධපුර ජය ශ්‍රී මහාබෝධීන් වහන්සේ සහ රුවන්වැලි මහාසෑය ඇතුළු අටමස්ථානයන්හි ආරක්ෂාව තහවුරු කිරීම- (න්‍යාය පත්‍රයේ විෂය අංක 23)

දෙස් විදෙස් බෞද්ධ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ ජය ශ්‍රී මහාබෝධීන් වහන්සේ සහ රුවන්වැලි මහාසෑය ඇතුළු අටමස්ථානයන්හි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මහා සංඝරත්නය ඇතුළු විවිධ පාර්ශ්වයන්ගෙන් යෝජනා ඉදිරිපත් වී ඇත. එම කරුණු සැලකිල්ලට ගෙන, ජය ශ්‍රී මහාබෝධිය හා රුවන්වැලි මහාසෑය වටා අධි ආරක්ෂිත වැටක් ඉදි කිරීම ඇතුළු ආරක්ෂිත විධිවිධාන සැලසීම පිණිස බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. වෘත්තීය පුහුණුව හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ක්ෂේත්‍ර සංවර්ධනය - (න්‍යාය පත්‍රයේ විෂය අංක 26)

වෘත්තිය පුහුණු කටයුතු සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන බාධා ඉවත් කිරීම සහ තාක්ෂණික සහය සැලසීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යුරෝ මිලියන 11ක තාක්ෂණික ආධාර ලබා දීම සඳහා ජර්මානු රජය විසින් එකඟතාව පළ කරනු ලැබ ඇත. එයින් යුරෝ මිලියන 7ක මුදලක් මාතර හා කිලිනොච්චියේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල වෘත්තීය පුහුණු කටයුතු සංවර්ධනය කිරීම සඳහාත් තවත් යුරෝ මිලියන 3.5ක මුදලක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ගෝලීය තරඟකාරිත්වය වර්ධනය කිරීම සඳහාත් වන වැඩසටහනක් සඳහා යෙදවීමට අපේක්ෂිතය. මෙම යුරෝ මිලියන 11ක තාක්ෂණික ආධාර ලබාගැනීම සඳහා ජර්මනිය සමඟ ගිවිසුමකට එළඹීම පිණිස මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **සමුපකාර ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා පනතක් කෙටුම්පත් කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 37)**

වර්තමානය වන විට දිවයින පුරා සමුපකාර ග්‍රාමීය බැංකු 2,269ක්, සමුපකාර ග්‍රාමීය බැංකු සංගම් 17ක් සහ මූල්‍ය සේවා සමුපකාර සමිති 8,004ක් ක්‍රියාත්මකව පවතියි. එමෙන්ම සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය මඟින් රුපියල් බිලියන 115ක් පමණ සාමාජික හා සාමාජික නොවන තැන්පතු ලෙස රැස් කරනු ලැබ ඇති අතර, රුපියල් බිලියන 59.8ක පමණ මුදලක් මුළු ණය ලෙස නිකුත් කරනු ලැබ ඇත. එයට අමතරව, අනෙකුත් මූල්‍ය සේවා සමුපකාර සමිති විසින් රුපියල් බිලියන 104ක පමණ මුදලක් තැන්පතු ලෙස රැස්කරනු ලැබ ඇති අතර, රුපියල් බිලියන 95ක පමණ මුදලක් මුළු ණය ලෙස නිකුත් කරනු ලැබ ඇත. සමුපකාර ව්‍යාපාරය ඉහත පරිදි මූල්‍යමය වශයෙන් ශක්තිමත් වුවද ඇතැම් මූල්‍ය සේවා සමුපකාර සමිතිවල දුර්වල මූල්‍ය කළමනාකරණය හේතුවෙන් ප්‍රාග්ධන අලාභවලට මුහුණ දීමට සිදුව ඇති බව හා අරමුදල් අනාරක්ෂිත තත්වයකට පත්ව තිබෙන බව නිරීක්ෂණය වී තිබේ. එබැවින් සමුපකාර මූල්‍ය ක්ෂේත්‍රය මුහුණ දී ඇති ගැටලු විසඳීම සහ සමුපකාර ග්‍රාමීය බැංකු හා අනෙකුත් මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමනය, අධීක්ෂණය, ප්‍රවර්ධනය හා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් නෛතික ප්‍රතිපාදන සැලසීම පිණිස පනතක් කෙටුම්පත් කිරීමට කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **සමුපකාර ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස විද්වත් මණ්ඩලයක් පත් කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 38)**

මෙරට මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද පුළුල් හා කාර්යක්ෂම සේවාවක් සපයමින් පොදු අරමුණු ඉටුකරගැනීම උදෙසා සමුපකාර ව්‍යාපාරය සුවිශේෂී දායකත්වයක් සපයනු ලබයි. එහෙත් මෙරට සමුපකාර ක්ෂේත්‍රය තුළ දේශපාලනීකරණය, අකාර්යක්ෂම කළමනාකරණය හා පරිපාලන ගැටලු ආදී තත්ත්වයන් නිරීක්ෂණය වී ඇත. එබැවින් සමස්ත සමුපකාර ක්‍රමවේදය, එහි දැනට පවතින ගැටලු, එම ගැටලු සඳහා විසඳුම් සහ ඒ සඳහා සමුපකාර නීති රාමුව තුළ සිදුවිය යුතු සංශෝධනය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විද්වත් මණ්ඩලයක් පත් කිරීම පිණිස කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **පොළොන්නරුව පූජා නගරයට පිවිසෙන පිවිසුම් මාර්ගය ආරම්භවන ස්ථානයේ වාහල්කඩ ඉදි කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 53)**

පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව උරුම නගරයක් ලෙස පොළොන්නරුව පූජා නගරය ආශ්‍රිත කලාපය සංවර්ධනය කිරීමට සැලසුම් කරනු ලැබ ඇත. ඒ අනුව පොළොන්නරුව නගරය නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගැනීමට හැකි වන පරිදි පොළොන්නරුව පූජා නගරයට පිවිසෙන හතමුණ මංසන්ධිය ආසන්නයේ, පොළොන්නරුව පුරවරයේ අනන්‍යතාව විදහා දැක්වෙන අයුරින් වාහල්කඩක් ඉදිකිරීම පිණිස නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **යාපනය, රුහුණ සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවල පහසුකම් පුළුල් කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 67)**

විශ්වවිද්‍යාල සිසුන් සඳහා අවශ්‍යවන පහසුකම් වර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල සඳහා අවශ්‍ය ගොඩනැගිලි හා යටිතල පහසුකම් වර්ධනය කිරීමට රජයේ අවධානය යොමු වී ඇත. ඒ අනුව, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය සඳහා තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 312.2ක මුදලකට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙතත්, රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 10ක වාට්ටු සංකීර්ණය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 1,138.3ක මුදලකට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙතත් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 378.8ක මුදලකට සීමාසහිත කේ.එස්.ජේ. කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම වෙතත්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි ප්‍රදානය කිරීම පිණිස නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය රවුෆ් හකීම් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **මුඛ, හනු හා මුහුණ පිළිබඳ ශල්‍ය පාරිභෝජ්‍ය අයිතම මිල දී ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය - (න්‍යාය පත්‍රයේ විෂය අංක 68)**

මුඛ, හනු හා මුහුණ පිළිබඳ ශල්‍යකර්ම සිදු කිරීම සඳහා භාවිත කරන ශල්‍ය පරිභෝජ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලයේ නිර්දේශය පරිදි ඇමරිකානු ඩොලර් 201,542.90ක මුදලකට කොරියාවේ M/s. Osteonic Co. Ltd. වෙත ප්‍රදානය කිරීම පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **සපුගස්කන්ද විදුලි බලාගාරයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 70)**

මෙගා වොට් 152කින් යුත් සපුගස්කන්ද විදුලි බලාගාරයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම පිණිස එහි විදුලි උත්පාදනය සඳහා යොදා ගන්නා එන්ජින් වර්ගවලින් අංක 05, 07, 08, 10 දරන එන්ජින් සෑම ධාවන පැය 6,000ක මෙහෙයුම් කාලයකට වරක් ද අංක 06, 09, 11, 12 දරන එන්ජින් සෑම ධාවන පැය 12,000ක මෙහෙයුම් කාලයකට වරක් ද ජනන පිරිවැඩියා කිරීම අවශ්‍ය වේ. ඒ අනුව එම අලුත්වැඩියා සඳහා අවශ්‍ය වන අමතර කොටස් මිල දී ගැනීම සඳහා වන කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි යුරෝ මිලියන 1.1ක මුදලකට එහි මුල් නිෂ්පාදකයා වන ජර්මනියේ M/s MAN Energy Solution SE වෙත ප්‍රදානය කිරීම පිණිස විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය හා මොණරාගල ග්‍රිඩ් උප පොළ 02 සඳහා මෙගා වොට් 1ක ධාරිතාවයෙන් යුත් විදුලි බලාගාර ඉදි කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 71)**

සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ දිවයින පුරා මධ්‍යම ජාලයට සම්බන්ධ කුඩා පරිමාණ සූර්ය බලාගාර 90ක් ඉදි කිරීම සඳහා සුදුසු ග්‍රිඩ් උපපොළවල් 17ක් හඳුනා ගන්නා ලදී. ඒ අතුරින් ත්‍රිකුණාමලය ග්‍රිඩ් උපපොළ සඳහා සම්බන්ධ කරගැනීමට අපේක්ෂිත මෙගාවොට් 1ක ධාරිතාවයෙන් යුත් සූර්ය බල ව්‍යාපෘති 7න් ව්‍යාපෘති 3ක් සීමාසහිත

සන්කෝර් සෝලර් සිටි පුද්ගලික සමාගම වෙතත්, ඉතිරි ව්‍යාපෘති 4 සීමාසහිත කැපිටල් සිටි හෝල්ඩින් පුද්ගලික සමාගම වෙත පිරිනැමීමටත්, මොණරාගල ග්‍රිඩ් උපපොළ සඳහා සම්බන්ධ කරගැනීමට අපේක්ෂිත මෙගාවොට් 1ක ධාරිතාවයෙන් යුත් සූර්ය බල ව්‍යාපෘති 5න් ව්‍යාපෘති 4ක් සීමාසහිත ගෝල්ඩන් කෝපරේෂන් ලංකා පුද්ගලික සමාගම වෙතත් ඉතිරි ව්‍යාපෘතිය සීමාසහිත නිහෝන් ග්‍රීන් පවර් කම්පැනි පුද්ගලික සමාගම වෙතත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය පරිදි ප්‍රදානය කිරීම පිණිස විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නාවික පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයේ ජම්බාර ගැසීම සඳහා වන කොන්ත්‍රාත්තුව - (න්‍යාය පත්‍රයේ විෂය අංක 74)**

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන වරාය ප්‍රවේශ ගුවන් මහාමාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නාවික පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයේ ජම්බාර ගැසීම සඳහා වන කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි රුපියල් මිලියන 624ක මුදලකට සීමාසහිත ඇක්සස් ඉංජිනියරින් පොදු සමාගම වෙත ප්‍රදානය කිරීම පිණිස මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **ගාල්ල දිස්ත්‍රික්කයේ ජාතික මහාමාර්ග කිලෝ මීටර් 51.7ක් වැඩිදියුණු කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 75)**

දකුණ, සබරගමුව, මධ්‍යම, වයඹ, උතුරු මැද පළාත් සහ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන සමාජ ආර්ථික මධ්‍යස්ථාන සමඟ ග්‍රාමීය ප්‍රදේශවල සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සහය යටතේ ක්‍රියාත්මක වන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ජාතික මහාමාර්ග කිලෝ මීටර් 51.7ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර තිබේ. එම මාර්ග වැඩිදියුණු

කර නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි සීමාසහිත කේ.ඩී.ඒ.වීරසිංහ (පෞද්ගලික) සමාගම විසින් චීනයේ Yunnan Construction and Investment Holding Group Co. Ltd. සමඟ ඇති කරගත් බද්ධ ව්‍යාපාරය වෙත රුපියල් මිලියන 6,108.2ක මුදලකට පිරිනැමීම පිණිස මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **ත්‍රිකුණාමලය අධිකරණ සංකීර්ණය ඉදි කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 76)**

ත්‍රිකුණාමලය අධිකරණ සංකීර්ණයෙහි පිහිටා ඇති ත්‍රිකුණාමල මහාධිකරණය, සිවිල් අභියාචනා මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය හා කම්කරු විනිශ්චය සභාව සඳහා භාවිතා කරනු ලබන ගොඩනැඟිලිවල පවතින සීමිත ඉඩකඩ හේතුවෙන් අධිකරණ කටයුතු සඳහා පැමිණෙන ජනතාව මෙන්ම ඒවායේ කාර්ය මණ්ඩලයද දැඩි අපහසුතාවයකට පත්වේ. ඒ අනුව අධිකරණ සේවා සඳහා ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් සලසා දීමේ අපේක්ෂාවෙන් රුපියල් මිලියන 250ක පමණ ආයොජනයක් යටතේ නව ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා වන උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත පිරිනැමීම පිණිස අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරල මැතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **වලපනේ නව අධිකරණ ගොඩනැඟිල්ල ඉදිකිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 77)**

වලපනේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය මඟින් වලපනේ, කෙරිපැහැ, රාගල, උඩුපුස්සැල්ලෑව, මතුරට, මන්දාරම්නුවර හා හඟුරන්කෙත යන පොලිස් බල ප්‍රදේශවලට අදාළ අධිකරණ සේවා සලසනු ලැබේ. එසේ වුවද, ඒ සඳහා භාවිතා කරනු ලබන ගොඩනැඟිල්ලේ පවතින සීමිත ඉඩ පහසුකම් හේතුවෙන් දැඩි අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වී තිබේ. එබැවින් වලපනේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය සඳහා නව ගොඩනැඟිල්ලක් එම අධිකරණ භූමියේම රුපියල් මිලියන 212.3ක

ආයෝජනයක් යටතේ ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබේ. ඒ සඳහා වන උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත පිරිනැමීම පිණිස අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරල මැතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

19. **2019 ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 79)**

2019 වර්ෂය සඳහා අනුමත රාජ්‍ය ණය ගැනීම් සීමාව තුළ ක්‍රියාකරමින් ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන්ද සැලකිල්ලට ගනිමින් ඇමරිකානු ඩොලර් මිලියන 1,500ක් දක්වා අරමුදල්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම මඟින් සපයා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම පිණිස මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

20. **'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' (Enterprise Sri Lanka) වැඩසටහන යටතේ ලබා දෙන මූල්‍ය පහසුකම් පුළුල් කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 80)**

රජයේ ප්‍රමුඛ වැඩසටහනක් වන එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, තරුණ තරුණියන්, කාන්තා ව්‍යවසායකයින්, ස්වයං රැකියාලාභීන්, උපාධිධාරීන් සහ විදේශ රැකියා නියුක්තිකයන් වෙනුවෙන් සහන පොළී ණය යෝජනා ක්‍රම 17ක්, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 03ක් සහ මූල්‍ය නොවන පහසුකම් සලසන වැඩසටහන් 02ක් ක්‍රියාත්මක වන අතර, මේ වන විට මෙම වැඩසටහන හරහා රුපියල් බිලියන 81ක පමණ ණය ප්‍රමාණයක් ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. ජාතික සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වන විවිධ පාර්ශ්වයන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගෙන 2019 අයවැය මඟින් දැනට ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම හරහා ලබා දෙන ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම සහ එම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන තාක්ෂණික ගැටළු අවම කිරීමේ අරමුණින් රන් අස්වැන්න, රිය ශක්ති, හෝම් ස්වීට් හෝම්, සිහින මාළිගා, සිටි රයිඩ්, ජය ඉසුරු, මිනි ටැක්සි/විදුලි ත්‍රීරෝද රථ සහ මගේ අනාගතය යන ණය යෝජනා ක්‍රම මහජනතාවට තවදුරටත් ප්‍රතිලාභ හා සහන අත්වන පරිදි සංශෝධනය කරනු ලැබ තිබේ. එසේ සංශෝධන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

21. **මැදි ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ කඩිනම් වැඩසටහන - (න්‍යාය පත්‍රයේ විෂය අංක 83)**

රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකෙහිම මැදි ආදායම් වැටුප් ලබන්නන්ට නිවාස පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව මැදි ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ කඩිනම් වැඩසටහන රජයේ ප්‍රමුඛ වැඩසටහනක් ලෙස දියත් කරන ලදී. එම වැඩසටහන යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්ට නිවාස ඒකකයක් මිල දී ගැනීම සඳහා රුපියල් මිලියන 5ක උපරිම ණය මුදලක් 7% ක පොලී අනුපාතයක් යටතේ ලබා ගැනීමට පහසුකම් සලසා තිබුණි. එසේ වුවද, වර්තමාන ආර්ථික වාතාවරණය අනුව උක්ත ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගෙන මෙම සහන ණය යෝජනා ක්‍රමය යටතේ සලසනු ලබන ණය මුදල රුපියල් මිලියන 10 දක්වා වැඩි කිරීමටත්, ඒ සඳහා වන පොලී අනුපාතිකය 6% දක්වා අඩු කිරීමටත් එමඟින් වැඩි පිරිසකට ප්‍රතිලාභ සැලසීමට හැකි වන පරිදි තෝරා ගැනීමේ නිර්නායක සංශෝධනය කිරීමටත් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා; සහ නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

22. **බස්නැවතුම්පොළ සහ දුම්රිය ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 85)**

දුම්රිය ස්ථානවල හා බස්නැවතුම්පොළවල පවතින මූලික සනීපාරක්ෂක පහසුකම් ඇතුළු යටිතල පහසුකම් ප්‍රමාණවත්ව සපයා නොමැති බැවින් එම ස්ථානවල පවතින සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට 2019 අයවැය මඟින් යෝජනා කර තිබිණි. ඒ අනුව ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය සහිතව සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කළ යුතු පොදු ස්ථාන හඳුනාගනිමින් මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිණිස මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

23. **සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 89)**

සමෘද්ධි වැඩසටහන යටතේ මේ වන විට පවුල් මිලියන 1.4ක් පමණ ප්‍රතිලාභ ලබන අතර, තවත් පවුල් 600,000කට පමණ ප්‍රතිලාභ සැලසීමට රජය විසින් සැලසුම් කරනු ලැබ ඇත. ඒ අනුව ඉදිරි තෙවසර තුළ පවුල් 500,000ක් සවිබල ගැන්වීමටත්, නිෂ්පාදන ව්‍යාපෘති 50,000ක් ක්‍රියාත්මක කිරීමටත් යෝජිතය. එසේම සමෘද්ධි ප්‍රතිලාභීන් ජීවත් වන ප්‍රදේශ තුළ අපනයන ගම්මාන 5,000ක් ස්ථාපිත කිරීමටද නියමිත අතර, ඒ මගින් ආර්ථික බෝග හා අපනයන බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. සමෘද්ධි ප්‍රතිලාභීන් ආර්ථිකයට හා අපනයන ඉපයීම්වලට දායක වන ශ්‍රම බලකායක් ලෙස සවිබල ගන්වා යැපුම් මානසිකත්වයෙන් ඔවුන් මුදවා ගැනීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් දිවයිනපුරා සිදු කිරීමටද පියවර ගෙන ඇති බව ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය දයා ගමගේ මැතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කරන ලදී.

24. **ජාතික ආරක්ෂාවට සහාය වීම සඳහා "ගම රැකුම" සංවිධාන ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ආරම්භ කිරීම - (න්‍යාය පත්‍රයේ විෂය අංක 91)**

පාස්කු ඉරුදින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් බලපෑමට ලක් වී ඇති ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය හා ආර්ථික තත්ත්වය යළි යථා තත්ත්වයට පත් කර ඔවුන්ගේ සිත් තුළ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා ආරක්ෂක අංශ මෙන්ම සෑම පුරවැසියෙකුගේම දායකත්වය අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ජනතාවගේ බහුවිධ ආරක්ෂක අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා බලධාරීන්ට සහාය විය හැකි "ගම රැකුම" නමින් හඳුන්වනු ලබන ස්වේච්ඡා ජනතා සංවිධානයක් දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන පරිදි පිහිටුවීමටත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමටත් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**************